

# පමා නොවී එම් අකුරට

රසික සූරියආරච්චි ලියයි

මා දහවන වසරේ සිට ඉගෙනුම ලැබීම සඳහා ආනන්දයට යාමට පටන් ගත් කාලය ලංකාවේ ඉතා සාමකාමී සමයක් විය. ඒ ව්‍යවහාර වර්ෂ එක්දහස් නමසිය හැත්තෑ හතේ මුල් කාලයයි. දුරෙයිඅප්පා ඝාතනය, වඩුක්කොඩෙයි සමුළුව වැනි මේ ආසන්න කාලයේ සිදුවුණා යැයි සැලකෙන, පසු කාලීනව සුවිශේෂී වැදගත් කමක් ගත්, සිද්ධීන් එකල අපේ කණ වැටී හෝ නොතිබුණි.

දේශපාලන වශයෙන් මන්දබුද්ධික පාරම්පරික දක්ෂිණාංශිකයෙක් වූ මම වයස පහලොවක්වත් නොඉක්මවූ කොළු ගැටයෙක් වීමි. එනිසාම, හැත්තෑ හතේ මැතිවරණයෙන් පසු මුදු හරිණු ලැබූ රාජ්‍ය ත්‍රස්තවාදයේ දරුණුකම මට එක් වරම නොපෙනුණි. ඉන්පසුව තැන, තැන ඇවිළුණු වර්ගවාදී ගිනිදැල් පවා මා සිත තුල නිසි කම්පනයක් ඇති නොකළේය.
මේ සියල්ල වෙනස් වෙන්නට පටන් ගත්තේ, 1980 ජූලි වැඩ වර්ජනයෙන් පසුවය. එය මේ ලිපි මාලාවට අදාල නොවන වෙනම ම කතාවකි.

හැත්තෑ හතේ සිදුවුණු දේශපාලන පෙරලියත් සමගම ලංකාවේ ජන සමාජය ද වෙනස් වෙන්නට පටන් ගත්තේය. එය ක්ෂණිකව නොව, හෙමින් ඇරඹී, ක්‍රම ක්‍රමයෙන් සිදුවූවක් වුවද, වසර දෙක තුනක් තුල සියල්ල කණපිට පෙරළුනා යැයි කිවහොත් එය අතිශයෝක්තියක් ම නොවේ.

## සෙකියුරිටි ජොබ් කට්ට

එකල, සතියකට වරක් කොළඹ කොටුවේ පැවැත්වුණු ජූඩෝ පන්තිවලට සහභාගී වීමට හෝ ඉඳහිට කලිසමක් මැසීම සඳහා රෙදි " ලෙන්ත්" එකක් ගැනීමට "වර්ල්ඩ් මාකට්ටුවට" යන අපට කොටුවේ, පිටකොටුවේ, ඕනෑම පාරක, ඕනෑම ගොඩනැගිල්ලක නිදහසේ ගැවසෙන්නට ඉඩ තිබුණි. කිසිවෙකු අපට අවහිර කලේ, සොයා බැළුවේ හෝ තර්ජනය කලේ හෝ නැත. කොළඹ කොටුවේ පාරක ගමන් කිරීමට තබා එහි සුවිසල් ගොඩනැගිලිවලට ඇතුළුවීමට වුවද, අනන්‍යතාපත්‍ර අවශ්‍ය නොවුණි.

නිදහස් ආර්ථිකය සමගින් ශ්‍රී ලංකාව තරණය කළ ආනයන ව්‍යාපාර සහ ශ්‍රමය මූලික කොටගත් විවිධ නිෂ්පාදන ව්‍යාපෘති නිසා රටේ මුදල් සංසරණය ද, ඒ සමගම ආරක්ෂා කරගත යුතු වූ පෞද්ගලික හිමිකම ඇති වස්තුව ද වැඩිවිය. ශ්‍රමික රැකියා ආර්ථිකයේ, නිෂ්පාදනය හා කෙලින්ම සම්බන්ධ වූ ශ්‍රමිකයින්ට අමතරව විවිධකාරයේ සේවා සැපයීම සඳහා වූ ශ්‍රම වෙළඳපොලක් ද ඒ හා සමගම ගොඩ නැගුණි. මෙහි ප්‍රධාන තැනක් ගත්තේ පෞද්ගලික ආරක්ෂක සේවා හෙවත් "සෙකියුරිටි සර්විස්" ය. නගරබදව මෙන්ම ග්‍රාමීයව පිහිටා තිබූ රජයේ දේපල සහ පෞද්ගලික ව්‍යවසාය ආරක්ෂාව සඳහා එයට පෙර ද ආරක්ෂක සේවා තිබුණි.ණිරැකීරක්ෂා ධුරාවලියේ පහල තලයක පිහිටි, මුරකරුවන් ලෙසින් හැඳින්වුණු ඔවුන් ගේ සේවය මුළුමනින්ම පාහේ යොමුවී තිබුණේ රාත්‍රී කාලයේ දී අදල දේපල ආරක්ෂා කිරීම සඳහාය. සරම, කමිසය සහ කෑලි පහේ " එවරෙඩි" විදුලි පන්දම මේ මුරකරුවන්ගේ නිල ඇඳුම විය.

නව ආර්ථිකයත් සමගම අළුතින් ඇරඹුණු මේ ආරක්ෂක සේවා, පෙර කී මුරකරු සේවයට වඩා ඉහල මට්ටමේ එකක් සේ බැළු බැල්මටම පෙනුණි. මේ "සෙකුරිටිකාරයින්" ගේ නිල ඇඳුම වුයේ දුඹුරු පැහැති දිගු කලිසම සහ බොහෝ විට සුදු හෝ දුඹුරු අත් කොට කමිසයයි. කමිසය විවිධ උරහිස් පටියෙන් ද, ලාංඡනයෙන් ද විසිතුරු වී තිබුණි. කළු සපත්තු යුගල ද ඒ හා සමගින් අනිවාර්‍යය විය. මීට අමතරව පොලිස් පරීක්ෂකවරුන් පැළඳි ආකාරයේ හිස් වැසුමක් ද සමහර සෙකුරිටි සේවාවල නිල ඇඳුමේ කොටසක් වී තිබුණි. මේ සියල්ලෙන්ම මැවී පෙනුනේ, රජයේ ආරක්ෂක සේවා වන පොලිසිය, සහ ත්‍රිවිධ හමුදා සේවාවන් ට සමාන ආකර්ෂණීය තත්වයකි.

ආරක්ෂක සේවා ශ්‍රම බලකාය සඳහා සැපයුම ලබාගන්නට ඒ ආකර්ෂණය අත්‍යවශ්‍යම නො-වුනේ, තරුණ පරපුරේ විරැකියාව ද එවකට සැලකිය යුතු මට්ටමක පැවති හෙයිනි.
ඒ සමගම, නව ආර්ථිකයේ රැකියා ධුරාවලියේ ද සෙකුරිටිකාරයින්ට හිමි වුයේ ද ඉන් පෙර මුරකරුවන්ට ලැබී තිබුණු තත්වයට වැඩි වූවක් නොවේ.

උසස් පෙල විභාගයෙන් පසුව, විශ්ව විද්‍යාලවල හෝ වෙනත් තෘතියික අධ්‍යාපන ආයතනවල ඉගෙනුම අරඹන්නට වරම් නොලබන තරුණ තරුණියන් හමුවේ එකල තිබූ විකල්ප ක්‍රියා මාර්ගන් වූයේ, එක්කෝ පෞද්ගලික ආයතනයක හරහා වෘතීමය අධ්‍යාපනයකට යොමු වීමයි. නැතිනම් කෙලින්ම රැකියාවක් සොයා ගැනීමයි. කොළඹ, නුවර වැනි නගරබද "කිරි" විදුහල්වල අධ්‍යාපනය ලැබූ තරුණ කොටස්වලට විවිධ පෞද්ගලික ආයතනවල කණිෂ්ඨ විධායක පුහුණු තනතුරු විවර වුවද, ගම්බද "කැකිරි" පාසල්වලින් පිට වෙන තරුණ තරුණියන් සඳහා විවර වූයේ බොහෝ විට කෙලින්ම ශ්‍රමය යෙදවීමට අවශ්‍ය නිල් කරපටි ආකාරයේ රැකියාය. ගම්බද තරුණියන් නිමි ඇඟළුම් කම්හල්වල රෙදි මහන්නියන් හෙවත් "ජුකී කෑලි" වෙද්දී, තරුණයින් විවිධ ව්‍යාපාරික ස්ථානවල ආරක්ෂක නිලධාරීන් හෙවත් "සෙක්කන්" වූයේ ඒ ආකා-ාරයෙනි.

මා ආනන්දයේ උසස් පෙල අවසන් වසරේ උගනිද්දී, එනම් 1980 වසරේ දී, ඊට පෙර වසරේ ගමේ පාසලේ උසස් පෙල හැදෑරූ මිතුරෙකු දිනක් බසයේදී මුණ ගැසුණි. දුඹුරු පැහැති කලිසමකින් ද, සුදු අත් කොට කමිසයකින් ද සැරසී සිටි ඔහු අත කුඩා බෑගයක් ද විය.
මගේ පැණයට පිලිතුරු දුන් ඔහු කියා සිටියේ, තමන් දැන් පෞද්ගලික ආරක්ෂක සේවයක සේවය කරන බවයි. සුදු කමිසයේ පැළඳිය හැකිවන සේ අයිලට් ඇල්ලූ දුඹුරු උරහිස් පටි දෙකක් ද ඔහු තම බෑගයෙන් ගෙන මට පෙන්වීය. ඒ බෑගයේ ම ඔහුගේ නිල ඇඳුමේ කොටසක් වූ නිල තොප්පියක් ද තිබෙනු මගේ මතකයේ ඇත.

පසුගිය වසරේ උසස් පෙල හැදෑරූ, විශ්ව විද්‍යාලයට යාමට වරම් ලබන තත්වයක් ලබා නොගත්, වෙනත් අධ්‍යාපනයක් ලබන්නටද කැමැත්තක් හෝ බොහෝ විට ආර්ථික හැකියා-වක් හෝ නොතිබුණු මගේ මිතුරා, ඒවනවිට කොළඹ තදාසන්න ආයතනයක පුහුණුවෙන ආරක්ෂක නිලධාරියෙකි.

එම වසරේ පැවති උසස් පෙල විභාගයේ ප්‍රතිපල ලැබීමෙන් අනතුරුව අපටද අනාගතය ගැන විවිධ තීරණ ගන්නට සිදුවිය. මේ කාලයේ වසර තුන හමාරක් මා සමග එකට ආනන්දයේ උගෙන උසස් පෙල විභාගයට මුහුණ දුන් මගේ මිතුරෙකුගෙන් ලැබුණු ලිපියකින් මා හද කම්පාවට පත්වුණි. විසිනම වසරකට පසුව අද ද මගේ සිතේ එද මෙන්ම හොඳින් රැඳී ඇති ඒ ලිපියෙන් කොටසක් මෙසේ විය.
"මට ආපහු උසස් පෙල කරන්න ආසා-වක් නෑ. මට ඕනෑ බැංකුවකට වගේ යන්න, බෑන්ක් ඔෆිසර් කෙනෙක් විදියට. ඒත්, ඒකට ක්‍රමයක් මට හිතාගන්න බැහැ."

"අපේ පවුලේ නෑයින් ගේ එච්චර හොඳ කනෙක්ෂන්ස් නෑනේ රසික."

"අපේ මස්සිනා කෙනෙක් නං මට කිව්වා බැංකුවේ සෙකුරිටි ජොබ් එකක් නං අල්ලලා දෙන්න පුළුවන් කියලා."

"ආනන්දෙටත් ගිහින් සෙකුරිටි ජොබ් කට්ටක් කරන්න පුළුවන්ද රසික? මං ගත් කටටම බැහැ කිව්වා."

"දැන් මස්සිනා මා එක්ක තරහයි!"

මගේ ඒ මිතුරා පාසල් දිනවලින් පසුව මා අද වන තුරු දැක නැත. මා ඔහු පදිංචිව සිටි නිවසට ඒ දිනවලම දිනයක ගියද, ඔවුන් ඒ කුලී නිවස හැරගොස් තිබුණි.

මින් වසර දෙක තුනක් ගතවන විට දිස්ත්‍රික් සංවර්ධන සභා මැතිවරණය, යාපනය පුස්තකාලය ගිනි තැබීම සහ අවසානයේ බිම් බෝම්බ පිපිරීම්, හමුදා මරණ සහ ජාතිවාදී කළබළ හරහා උතුරේ ජනවාර්ගික ප්‍රශ්ණය මුළු රටම වෙලාගත් අතර, ඇවිලෙන්නට පටන් ගත් වර්ගවාදී යුද්ධයේ ඉත්තන් වී මරණ සහතිකය අත්සන් කර රැකියා ප්‍රශ්ණය විසඳා ගන්නට තරුණ කොටස්වලට ඉඩ ප්‍රස්ථාව සැලසුණි.

Well experienced teacher at Noble Park
offers tution in
MATHEMATICS AND SINHALESE
to 1-8 level students.
Contact : Shirley
9546 0979 or 0421 903 572

ABN 399 885 48425
SRI WRECK
TOWING



VEHICLE TRANSPORT
BREAKDOWNS
FREE OLD CAR REMOVALS
RELIABLE RATES
TILT TRAY TRUCK
ALL AREAS
24 hours 7 days a week
0433 495 548
udesha@bigpond.com Tel 5995 6105